# මානව අයිතිවාසිකම් හා ත්‍රස්තවාදය පිටු දැකීම : ත්‍රස්තවාදයට එරෙහිව කටයුතු කරන අවස්ථාවල මානව අයිතිවාසිකම් ප්‍රවර්ධනය කර, ආරක්ෂා කිරීම සඳහාවූ එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරු තමන්ගේ ශ්‍රී ලංකා චාරිකාව නිම කරයි

## ශ්‍රී ලංකා චාරිකාවේ ප්‍රාථමික නිගමනයන්

කොළඹ (ජූලි 14, 2017) - ත්‍රස්තවාදයට එරෙහිව කටයුතු කරන අවස්ථාවල මානව අයිතිවාසිකම් හා මූලික නිදහස් ප්‍රවර්ධනය කර, ආරක්ෂා කිරීම සඳහාවූ එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරු බෙන් එමර්සන් මහතා 2017 ජූලි මස 10 වෙනි සිට 14 වෙනි දින දක්වා ශ්‍රී ලංකාවේ චාරිකාවක යෙදුනේය. ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා තමන්ට ආරාධනාවක් ලබාදීම වෙනුවෙන් ඔහු ශ්‍රී ලංකා රජයට තමන්ගේ ස්තූතිය පලකර සිටී. මෙම ගමනේ අරමුණ වන්නේ අභ්‍යන්තර අවි ගැටුම අවසන්වීමෙන් පසු ත්‍රස්තවාදයට එරෙහි සටනේදී ශ්‍රී ලංකාව එහි නීති, ප්‍රතිපත්ති හා භාවිතයන්වල ලඟා කරගෙන ඇති ප්‍රගතිය ඇගයීම වේ. විශේෂයෙන් සංහිඳියාව හා වගවීම තහවුරු කිරීමේ ශ්‍රී ලංකාවේ ප්‍රයත්නයන්වල සාර්ථකත්වයට මෙම ක්ෂේත්‍රවල සිදුවන ප්‍රගතිය ඉතා වැදගත් වන අතර, ජාත්‍යන්තර මානව අයිතිවාසිකම් නීතිය ප්‍රකාරව ඒවා මනිනු ලැබේ.

ශ්‍රී ලංකාව සඳහාවූ තමන්ගේ නිල චාරිකාවට මුලපිරීම් කර, එයට පහසුකම් සැලසීම සඳහා රජය විසින් දක්වන ලද විනීත, ඵලදායි හා සහයෝගිතාවයෙන් යුත් ප්‍රතිචාර විශේෂ වාර්තාකරු විශේෂයෙන් මෙහි ඇගයීමට ලක් කරයි. එම තත්ත්වය අවංක හා විවෘත සංවාදයකට අවස්ථාවක් උදා කළේය. විශේෂ වාර්තාකරු තමන් හමුවූ රජයේ ආයතනවල ප්‍රධානීන්ට හා එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලංකා කණ්ඩායමට හා එහි නේවාසික සම්බන්ධීකාරකවරයාට මෙම චාරිකාවේදී ඔවුන් දක්වන ලද සහයෝගයට විශේෂයෙන් තමන්ගේ කෘතඥතාවය පලකර සිටී. අග්‍රාමාත්‍යවරයා, ජනාධිපති ලේකම්වරයා, ආරක්ෂක ලේකම්වරයා, විදේශ කටයුතු අමාත්‍යවරයා, නීතිය හා සාමය දක්ෂිණ සංවර්ධන අමාත්‍යවරයා, බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්තාපන, නැවත පදිංචි කිරීමේ හා හින්දු ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යවරයා යන අය හමුවී ඵලදායි හා තොරතුරු ලබා ගන්නා ආකාරයෙන් අදහස් හුවමාරු කර ගැනීමට ඔහුට අවස්ථාවක් ලැබිණි. තවද, විශේෂ වාර්තාකරු ආරක්ෂක අමාත්‍යාංශයේ මාණ්ඩලික ප්‍රධානී, නාවික හමුදාව, යුධ හමුදාව හා ගුවන් හමුදාවේ හමුදාපතිවරුන්, ජාතික බුද්ධි අංශයේ ප්‍රධානී, ජාතික පොලිස් කොමිසමේ සභාපතවරයා, පොලිස්පතිවරයා, විශේෂ කාර්ය බලකායේ ප්‍රධානී, අපරාධ විමර්ශන අංශයේ ප්‍රධානී, ත්‍රස්තවාදී විමර්ශන ඒකකයේ ප්‍රධානී හා පුරුත්තාපන කොමසාරිස් ජනරාල්වරයා යන නිලධාරිවරුන්ද හමුවීය. අධිකරණ අමාත්‍යවරයාද ඔහු හමුවිය.

විශේෂ වාර්තාකරු හා ඔහුගේ කණ්ඩායම නීතිපතිවරයා, අග්‍ර විනිශ්චයකාරතුමා කොළඹ, අනුරාධපුර හා වව්නියා යන ප්‍රදේශවල මහාධිකරණ විනිසුරුවරුන්ද හමුවී සාකච්ඡා පැවැත්වූහ. කොළඹ නව මැගසින් බන්ධනාගාරයට හා අනුරාධපුර බන්ධනාගාරයටද ඔහු ගිය අතර, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ චෝදනා ලැබ සිටින රැඳවියන් පුද්ගලිකව හමුවීමටද, ඔවුන්ගෙන් සමහර අය රඳවා තිබෙන පිළිකුල් තත්ත්වයන් අධීක්ෂණය කිරීමටද ඔහුට අවස්ථාවක් ලැබුණි. තවද විශේෂ වාර්තාකරු රැඳවියන්ගේ නීතිඥයින්, පවුලේ සාමාජිකයන් හා ශ්‍රී ලංකාවේ ත්‍රස්තවාදය වැළැක්වීමේ නීතිය හා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම හේතුවෙන් පීඩාවට පත්වී සිටින අනෙකුත් පුද්ගලයන් ඇතුළු පාර්ශවයන්ද හමුවීය. අවසානයේදී ඔහු මානව හිමිකම් කොමිසමේ සභාපතිවරයාද, කොමසාරිස්වරයෙකුද, සිවිල් සමාජයේ නියෝජිතවරුන්ද හමුවීය.

ශ්‍රී ලංකාවේ දීර්ඝ හා සංකීර්ණ ජනවාර්ගික අර්බුදය හා එය විසින් නිර්මාණය කරන ලද අතිශය ලෙස ප්‍රබල ආරක්ෂක අභියෝගයන් පිළිබඳව විශේෂ වාර්තාකරු සම්පූර්ණයෙන් දැන සිටී. වසර 26 ක් පුරාම ශ්‍රී ලංකාවට විමුක්ති කොටි සංවිධානය විසින් සිදුකරන ලද ත්‍රස්තවාදී ප්‍රචණ්ඩ ක්‍රියාකාරකම්වලට

මුහුණදීමට සිදුවිය. මෙම ක්‍රියාකාරකම්වලට මරාගෙන මැරෙන බෝම්බ පිපිරීම් හා දේශපාලන ඝාතනද ඇතුල් විය. මෙම දීර්ඝකාලයක් දිග්ගැස්සී ගිය මෙම ගැටුම 2009 වසරේදී අවසන් විය.

2015 වසරේදී ශ්‍රී ලංකාවේ සහාග රජයක් කරා දේශපාලන වෙනසක් ඇතිවූ අතර, එය ශ්‍රී ලංකාවේ සියලුම ජනතාව තුළ ප්‍රතිසංස්කරණ, ඇතුළත්කරණය, යුක්තිය හා මානව අයිතිවාසිකම් සඳහා ගරුත්වය යන කරුණු පිළිබඳ විශ්වාසයක් දැල්වීය. මෙම ගැම්ම හේතුවෙන් ශ්‍රී ලංකාව තුළ සංහිඳියාව, වගවීම හා මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම සඳහා රාමුවක් ස්ථාපිතවූ අතර, එය ශ්‍රී ලංකා රජයේ සම අනුග්‍රහය සහිතව එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් කවුන්සලය විසින් යෝජනා අංක 30/1 විසින් සම්මත කර ගන්නා ලදී. එක්සත් ජාතීන්ගේ යෝජනාව අතීතය ආමන්ත්‍රණය කිරීමටත්, රජයේ නිලධාරීන් විසින් සිදුකරන ලද අපරාධ ක්‍රියා පිළිබඳ මුක්තිය හා සම්බන්ධ සංස්කෘතිය අවසන් කිරීමටත්, වගවීම, සාමය හා යුක්තිය තහවුරු කිරීමටත්, තිරසාර සංහිඳියාවක් ලඟාකර ගැනීමටත්, අතීතයේදී දෙපාර්ශවයන් විසින් සිදුකරන ලද මානව අයිතිවාසිකම් උල්ලංඝනයවීම් සිදුවීම වළක්වා ගැනීමටත් ශ්‍රී ලංකා රජයේ කැපවීම නියෝජනය කරන අතර, එය පිළිබිඹු කරයි.

කෙසේවෙතත්, මෙම තත්ත්වයට දැන් වසර 2 ක් ගතවී ඇත. තවද මානව අයිතිවාසිකම් කවුන්සිලය විසින් ශ්‍රී ලංකාවට ලබාදී තිබූ වසර 2 ක කාලයද අවසන්වී දැන් මාස 4 ක් ගතවී තිබේ. මෙම යෝජනාවේ සඳහන් කර ඇති ප්‍රධාන අරමුණු ඉටුකිරීමේ ප්‍රගතිය ඉතා මන්දගාමී මට්ටමක පවතින අතර, එය බොහෝ දුරට දැනට අඩපනවී ඇති බව පෙනේ. ශ්‍රී ලංකාවේ සන්ක්‍රාන්ත්‍රික යුක්ති බැදීම් ඉටුකර ගැනීම සඳහා අද වන තෙක් ක්‍රියාත්මක කරන ලද කිසිම පියවරයක් සත්‍ය වශයෙන් ප්‍රගතියක් ලඟාකර ගැනීමට ප්‍රමාණවත් නොවේ. ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදාවල යුධ අපරාධ කළ සාමාජිකයන් නීතිය ඉදිරියට රැගෙන ඒමේ ක්‍රියාවලියේද ප්‍රගතියක් සිදුවී නොමැත.

ත්‍රස්තවාදය වැළැක්වීමේ නව සංශෝධන ක්‍රියාවලිය සම්පූර්ණවීමෙන් පසු සත්‍ය හා සංහිඳියා කොමිසම් සභාවක් ස්ථාපිත කිරීම සඳහා පනතක් සම්මත කර ගන්නා බවත්, ගැටුමේදී දෙපාර්ශවයන් විසින්ම සිදුකරන ලද ඉතා බරපතල අපරාධ සඳහා අපරාධ චෝදනා ගොනු කිරීමට විශේෂ නඩු පැවරීමේ කාර්යාලයක් ස්ථාපිත කිරීමට කටයුතු කරන බවත් අග්‍රාමාත්‍යවරයා විශේෂ වාර්තාකරුට පුද්ගලිකව පොරොන්දුවක් ලබා දුන්නේය. මෙම පියවරයන් ඇත්ත වශයෙන්ම ජාත්‍යන්තර ප්‍රජාවට ශ්‍රී ලංකා රජය විසින් ලබාදෙන ලද පොරොන්දු වන අතර, එම පොරොන්දු දැනටමත් සම්පූර්ණ කළ යුතුව තිබිණි.

මෙම දිශාව කෙරෙහි ධනාත්මක නැඹුරුවක් පිළිබඳ යම් තරමක දර්ශක පෙනෙන්නට තිබෙන බව සාධාරණව පැවසිය හැකිය. විශේෂ වාර්තාකරුගේ චාරිකාවේදී හමුදාපති මහේෂ් සේනානායක මහතා අපරාධ සිදුකර ඇති සන්නද්ධ හමුදාවල සාමාජිකයන් නීතිය ඉදිරියේ රැගෙන එන බව ප්‍රසිද්ධියේ පොරොන්දුවක් ලබා දුන්නේය; ගැටුමේ අවසන් අදියරේදී පුද්ගලයන් 11 දෙනෙක් අතුරුදහන්වීම පිළිබඳව චෝදනා මත මෑතකදී නාවික හමුදාවේ ජ්‍යේෂ්ඨ කොමාන්ඩෝවරයෙකු අත්අඩංගුවට ගනු ලැබීය; හමුදා නිලධාරීන්ට එරෙහි අපරාධ චෝදනා තමන්ගේ කාර්යාලය වෙත ලැබෙන ඕනෑම මොහොතක නීතියේ සම්පූර්ණ බලය යොදා පුද්ගලයන්ට විරුද්ධව නඩු පවරන බව නීතිපතිවරයා විශේෂ වාර්තාකරුට තහවුරුවක් ලබා දුන්නේය. ශ්‍රී ලංකාව තිරසාර සාමයක් ලඟා කර ගතයුතු නම් රටේ නීතිය ක්‍රියාත්මක කරන ආයතන දමිළ හා මුස්ලිම් සුළු ජන කණ්ඩායම් ඇතුළුව සමාජයේ සියලුම කොටස්වල විශ්වාසය දිනා ගත යුතුය යන කරුණ නීතිපතිවරයා පිළිගෙන ඇත.

නමුත් මෙම සියලුම දර්ශකයන් ශ්‍රී ලංකාව මුහුණපා සිටින ප්‍රශ්න සඳහා සියලුම ප්‍රජාවන්ට ප්‍රතිලාභයක් අත්වන ආකාරයේ තිරසාර හා සාධාරණ විසඳුමක් ලඟාකර ගැනීම පිළිබඳ එම රට ජාත්‍යන්තර ප්‍රජාවට ලබාදී ඇති පොරොන්දුවට ඉතා පහළ මට්ටමක පවතී. සමානාත්මතාවය හා වගවීමේ මූලධර්මයන් විසින් ක්‍රියාත්මක කරනු ලබන අර්ථාන්විත සන්ක්‍රාන්තික යුක්ති ක්‍රමවේදයක් ස්ථාපිත කරන බවත්, ආරක්ෂක අංශය පිළිබඳ අත්‍යවශ්‍ය හදිසියෙන් සිදුකළ යුතු ප්‍රතිසංස්කරණ සිදුකරන බවත් ශ්‍රී ලංකාව ජාත්‍යන්තර ප්‍රජාවට පොරොන්දුවී තිබිණි.

එල්ටීටීඊ සංවිධානය හා සම්බන්ධවී සිටි බව කියන පුද්ගලයන්ට සමාව ලබාදීමේ මූලික වැඩසටහනක් ක්‍රියාත්මක කර, එම පුද්ගලයන් පුනරුත්ථාපන ක්‍රමයකට යොමුකර ඇත. ඒවාගේම බොහෝ දෙනෙක් දැඩි දෝෂ සහිත ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ පීඩාවට පත්වී සිටිති. මෙම නීතිය 1979 වසරේ හදිසි අවස්ථා සඳහාවූ පියවරක් වශයෙන් තාවකාලිකව පනවන ලදී. එය පසුව 1982 වසරේදී ස්ථිර කරන ලද අතර, අද වනතෙක් නීති පොතේ පවතී. පාපොච්චාරණ සඳහාවූ එකම පදනමක් ලෙස පොලිස් නිලධාරීන් වෙත ඉදිරිපත් කරන ලද (වෙනත් සාක්ෂිවලින් තහවුරු නොකරන ලද) පාපොච්චාරණයන් පාවිච්චි කිරීමට ඉඩ සලසන ව්‍යාතිරේක ප්‍රතිපාදන හරහා එය අඛණ්ඩව ක්‍රමානුකූලව වදහිංසා සිදුකරන තත්ත්වය පෝෂණය කර ඇත. සමස්ථ ප්‍රජාවම මෙය හරහා හිරිහැරවලටත්, අත්තනෝමතිකව අත්අඩංගුවට ගැනීම හා රඳවා ගැනීම යන තත්ත්වයන්ට ගොදුරුවී සිටින අතර, එල්ටීටීඊ සංවිධානය සමඟ කුමන හෝ ආකාරයක වක්‍ර සබඳතාවයක් හෝ පවත්වන බව සැක කරන ඕනෑම පුද්ගලයෙක් රඳවා ගැනීමේ හා වදහිංසාවට ලක්වීමේ ක්ෂණික අවදානමකට ලක් වේ.

වදහිංසාව පාවිච්චි කිරීම පිළිබඳ කිසිසේත්ම ‘නොඉවසන ප්‍රතිපත්තියක් ’ මෑතක සිට රජය පිළිපදින කරුණ කෙරෙහි විශේෂ වාර්තාකරු සතුටට පත්වෙයි; තවද පොලිසිය විසින් සිදුකරන වදහිංසා තුරන් කිරීම සඳහා 2016 ජූලි මාසයේදී කමිටුවක්ද පත්කර ඇත. කෙසේවෙතත්, ශ්‍රී ලංකාවේ එවැනි භාවිතයන් ආරක්ෂක අංශය තුළ ගැඹුරින් කිදා බැස ඇති අතර, වදහිංසා සිදුකිරීම ශ්‍රී ලංකාවේ අද වන තෙක් සිදුවන බවත්, එය සාමාන්‍යයෙන් සිදුවන ක්‍රියාවලියක් බවත් නිගමනය කිරීමට අවශ්‍ය සියලුම සාක්ෂි තිබේ. ජාතික ආරක්ෂක හේතූන් මත අත්අඩංගුවට ගෙන, රඳවා ගෙන තිබෙන පුද්ගලයන් මෙම තත්ත්වයට මුහුණ දෙති. දමිළ ප්‍රජාවගේ සාමාජිකයන්ට එරෙහිව බලධාරීන් ප්‍රමාණයට වඩා නීතිය ක්‍රියාත්මක කරන හේතුව නිසා එම ප්‍රජාව රජයේ බාධාවකින් තොරව ක්‍රියාත්මක වන වදහිංසා යාන්ත්‍රණයට ගොදුරුවී ඇත.

මෙම පසුබිම තුළ 2016 වසරේ අග භාගයේදී ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගනු ලැබූ පුද්ගලයන්ගෙන් 80% ක් තමන් අත්අඩංගුවට ගැනීමෙන් පසු වදහිංසාවලට හා ශාරීරික හිරිහැරවලට ලක්වූ බව පැමිණිලි කර තිබෙන තත්ත්වය පිළිබඳ විශේෂ වාර්තාකරු තමන්ගේ දැඩි කනස්සල්ල පල කරයි. මෙම සිදුවීම් පසුව සාමාන්‍ය අපරාධ නීතිය යටතට ගන්නා ලදී. රැඳවුම් මධ්‍යස්ථානවල සිටින රැඳවියන් වදහිංසාවට ලක් කිරීම පිළිබඳ කරුණු තමන්ගේ වැඩවල ප්‍රමුඛතා අංගයක් ලෙස පවතින බවත්, එය වැදගත් මානව අයිතිවාසිකම් ප්‍රශ්නයක් ලෙස සැලකිය හැකි බවත් මානව හිමිකම් කොමිසම අවධාරණය කළේය.ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ගොනුකර ඇති නඩු සඳහා වගකීම් දරණ කොළඹ ශ්‍රේෂ්ඨ විනිසුරුවරයෙක් ඔහු 2017 දක්වා සම්බන්ධවී ඇති නඩුවලින් 90% කට වැඩි නඩුවලට අදාළ අත්‍යවශ්‍ය පාපොච්චාරන සාක්ෂිය ඉවත් කිරීමට තමන්ට සිදුවූ බව විශේෂ වාර්තාකරු සමඟ පැවසීය. තර්ජනය කිරීම හෝ බලහත්කාර කිරීම මගින් එවැනි පාපොච්චාරන ලබාගෙන තිබීම එයට හේතුව විය. ස්වේච්ඡාවෙන් ඒවා ලබාදී නොමැත.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ කලින් රඳවා ගෙන තිබූ රැඳවියන් හා දැනට රැඳවුම් මධ්‍යස්ථානවල සිටින රැඳවියන් සමඟ සම්මුඛ සිදුකළ සම්මුඛ සාකච්ඡාවලදී  ඉතා කෲර වදහිංසා ක්‍රම පිළිබඳ කතන්දරවලට සවන්දීමට විශේෂ වාර්තාකරුට සිදුවිය. පොලුවලින් පහරදීම, මානසික ආතතිය ඇති කරන ක්‍රමයන් පාවිච්චි කිරීම,  භූමිතෙල් මිශ්‍ර කරන ලද ප්ලාස්ටික් මලු පාවිච්චි කරමින් හුස්ම හිර කිරීම, නියපොතු ගැලවීම, නියපොතු අස්සේ ඉදිකටු ඇතුල් කිරීම, විවිධ ආකාරයෙන් ජලය මගින් වදහිංසා සිදුකිරීම, පුද්ගලයන් පැය කිහිපයක කාලයක් ඔවුන්ගේ මහපට ඇඟිලිවලින් එල්ලා තැබීම හා ප්‍රජනන ඉන්ද්‍රියයන් අංගඡේදනය කිරීම වැනි වධහිංසාද මෙයට ඇතුළුවිය. විශේෂ වාරතාකරුගේ අවධානය සඳහා යොමු කරන ලද මෙම සිදුවීම් කිහිපයක්  එක්කෝ ස්වාධීන වෛද්‍ය සාක්ෂි හරහා තහවුරුවී තිබුණි; එසේ නැත්නම් නඩු විභාගයේදී පාපොච්චාරන ඉවත් කිරීම සඳහාවූ පදනමක් ලෙස අධිකරණය විසින් පිළිගෙන තිබුණි.

ශ්‍රී ලංකාවේ වදහිංසා සිදුකර කරන දැඩි කම්පනයට පත් කරන තත්ත්වයන් පවතින නමුත්, එවැනි චෝදනා පිළිබඳ සාර්ථක ආකාරයෙන් විමර්ශන නොපැවැත්වීම පිලිබඳ කරුණ විශේෂ වාර්තාකරු මෙහි සඳහන් කරයි. මෑත කාලයේ නිල සංඛ්‍යාලේඛණ ලබාදෙන ලෙස කරන ලද ඉල්ලීමකට ප්‍රතිචාරයක් වශයෙන් ඔහුට ලැබුණු කරුණු අනුව, සැකකරුවන්ට වදහිංසා පමුණුවීම පිළිබඳව පොලිස් නිලධාරීන් 71 දෙනෙකුට එරෙහිව පමණක් කටයුතු කර ඇති බව දැන ගන්නට ලැබුණි. පුද්ගලයන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා ගෙන සිටින අවස්ථාවල දැනට මානව හිමිකම් කොමිසමට එය පිළිබඳව සාමාන්‍යයෙන් දැනුම් දෙනු ලබන බවද, සියලුම රැඳවුම් මධ්‍යස්ථානවලට එම කොමිසමට බාධාවලින් තොරව පිවිසීමේ හැකියාව තිබෙන බවද විශේෂ වාර්තාකරු මෙහි සඳහන් කරයි. කෙසේවෙතත්, පාපොච්චාරන මගින් අපරාධ පිළිබඳ කට උත්තර ලබා ගැනීමේ ක්‍රමයක් මත රඳා පවතින මෙම තත්ත්වය හා අනෙකුත් ආරක්ෂක පියවරයන්, මෙවැනි ඉතාම බියගුළු ජාත්‍යන්තර අපරාධවලට එරෙහිව සැකකරුවන් ආරක්ෂා කිරීමට ප්‍රමාණවත් නොවන බව ඔප්පුවී ඇත.

පාපොච්චාරන ලබා ගැනීම සඳහා ක්‍රමානුකූලව වදහිංසාව යොදා ගැනීමේ වැදගත්කම, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ගොනුකර ඇති නඩුවල හෙළා දැකිය යුතු ප්‍රමාදවීම් තත්ත්වය සමඟ බැලිය යුතුව ඇත. දීර්ඝ කරන ලද විධායක රැඳවුම් ක්‍රම හා දැඩි ලෙස දිග් ගැසෙන අපරාධ නඩුවල ක්‍රියා පටිපාටිවල එකතුව හේතුවෙන් ත්‍රස්තවාදය වැළක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගෙන ඇති සැක කරුවන් සාමාන්‍යයෙන් වසර ගණනාවක් කිසිම චෝදනාවකින් තොරව හා ඔවුන්ගේ රැඳවුම් භාරයේ සිටින කිසිම අධිකරණ සමාලෝචනයකින් තොරව අමානුෂික හා පිලිකුල් සහගත තත්ත්වයන් තුළ රඳවා ගෙන සිටිනු ලැබේ.

ශ්‍රී ලංකාවේ දැනටමත් ක්‍රියාත්මක වන ක්‍රමය යටතේ ප්‍රධාන නඩු පවරන නිලධාරියා වන නීතිපතිවරයාට ඕනෑම ඇප අයදුම්පතක් පිළිබඳ අවසන් තීරණය ගැනීමේ අයිතිය සතුව ඇත. මෙම භාවිතය මෑත කාලයේ වෙනස්වීමට පටන් ගෙන තිබෙන නමුත් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අතීතයේ ගොනුකර තිබූ නඩුවලදී මෙයට අනුමැතිය ලබාදීම ඔහු සහමුලින්ම ප්‍රතික්ෂේප කර ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් නීතියේ ආධිපත්‍යට හෝ ප්‍රජාතන්ත්‍රවාදී යුක්තියේ මූලික මූලධර්මයන්ට සම්පූර්ණයෙන් පටහැනි වන ආකාරයට විධායකය විසින් නීති විරෝධී ලෙස අධිකරණයේ දෑස් බැඳ තිබුණි.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා ගෙන සිටින පුද්ගලයන්ගේ වැදගත් කොටස් නියෝජනය කරන පුද්ගලයන් විශේෂ වාර්තාකරු හමුවූ අතර, ඔවුන් රැඳවුම් භාරයේ සිටින කාලය ද්විත්ව සංඛ්‍යාවල තිබේ. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ දැනට චෝදනා ලැබ සිටින පුද්ගලයන් පිළිබඳ නිල සංඛ්‍යාලේඛණ ලබාදෙන ලෙස ඔහු විසින් කරන ලද ඉල්ලීමක් අනුව ඔහු වෙත ලබාදී තිබූ සංඛ්‍යාලේඛණවලින් පහත සඳහන් කරුණු අනාවරණය වේ. දැනට අධිකරණ ගඳවුම් භාරයේ සිටින සිරකරුවන් 81 දෙනෙකුගෙන් 70 දෙනෙක් වසර 5 කට වැඩි කාලයක් කිසිම නඩු විභාගයකින් තොරව රැඳවුම් භාරයේ පසුවෙති; පුද්ගලයන් 12 දෙනෙක් වසර 10 කට වැඩි කාලයක් නඩු විභායකින් තොරව රැඳවුම් භාරයේ සිටිති. මෙම විශ්මයජනක සංඛ්‍යාලේඛණ ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර කීර්තිනාමයට කැළලක් වේ. මෙම පුද්ගලයන් වහාම ඇප මත මුදා හැරීමට පියවරයන් ගත යුතුය; එසේ නැත්නම් වසර ගණනාවකින් හෝ දශක ගණනාවකින් නොව සති හෝ මාස කිහිපයක් තුළ ඔවුන්ට එරෙහිව නඩු පැවරිය යුතුය. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ඇතුළු මෙම සම්පූර්ණ පද්ධතිය අද වන තෙක් ක්‍රියාත්මකවී ඇති ආකාරය හා එය අදාළ වන නඩු සඳහා අඛණ්ඩව ක්‍රියාත්මක වන ආකාරය සම්පූර්ණයෙන් යුක්තිය ලබා නොදෙන තත්ත්වයක සමාන වේ.

තවමත් සිරගතවී සිටින පුද්ගලයන්ගේ රැඳවුම් භාර තත්ත්වයේ නීත්‍යානුකූලත්වය අධිකරණ සමාලෝචනයකට ලක් කිරීම සඳහා ශ්‍රී ලංකා රජය වහාම කටයුතු කළ යුතු බව විශේෂ වාර්තාකරු ඉල්ලා සිටින අතර, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ චෝදනාවලට ලක්වී සිටින පුද්ගලයන් නිසි

ක්‍රියාවලිය පිළිබඳ සියලුම තහවුරුවන් සහිත සාධාරණ නඩු ක්‍රමයකට යොමු කළ යුතුය. පොලිස් නිලධාරීන් විසින් සිදුකරන ලදැයි කියන වදහිංසා පිළිබඳ සියලුම චෝදනා විමර්ශනය කිරීම සඳහා සාර්ථක යාන්ත්‍රණයක් ස්ථාපිත කළ යුතු බවත්, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ පාපොච්චාරනයක් සාක්ෂියක් වශයෙන් පොලිසිය විසින් ඉදිරිපත් කර, වරදකරුවන් කර ඇති සියලුම පුද්ගලයන්ගේ ආරක්ෂාව සමාලෝචනය කිරීම සඳහා යාන්ත්‍රණයක් ස්ථාපිත කළ යුතු බවත් ඔහු රජයෙන් ඉල්ලා සිටී.

එම තත්ත්වය සඳහා රජය හා එහි නිලධාරීන්ගේ ප්‍රතිචාරය කුමක්ද? මෙම විශාල පරිමාණයේ අයුක්තිය අවම කිරීමේ ප්‍රයත්නයක් වශයෙන් තමන්ගේ කාර්යාලය ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රැඳවුම් භාරයේ සිටින සියලුම පුද්ගලයන්ගේ සිදුවීම් සමාලෝචනය කිරීම සඳහා වසර 2 ක් ගත කළ බව නීතිපතිවරයා විශේෂ වාර්තාකරුට දැන්වීය. තවද, ඇප ලබාදීමට එකඟ වන විධායක තීරණ ගන්නා බවත්, පුද්ගලයන් පුනරුත්තාපන වැඩසටහන්වලට යොමු කිරීමට කටයුතු කරන බවත් එසේ නැත්නම් උචිත අවස්ථාවල අපරාධ චෝදනා අවම කරන බව හෝ අත්හරින බවත් ඔහු සඳහන් කළේය. මෙම උත්සාහය මෙම පද්ධතියේ නොවිසඳී තිබෙන සමහර සිදුවීම් අවම කර ගැනීමේ චේතනාවෙන් සිදුකර ඇති අතර එය ඇත්ත වශයෙන්ම එය පිළිගත යුතුයි. කෙසේවෙතත්, පුද්ගලයන් වසර 12 කට පසුවත් අධිකරණයට ඉදිරිපත් නොකර තවමත් සැක සහිත පාපොච්චාරන මත රැඳවුම් භාරයේ තබාගෙන සිටින තත්ත්වයට මෙය විසඳුමක් නොවේ.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අලුතින් පුද්ගලයන් අත්අඩංගුවට ගැනීම වළක්වා ගැනීම සඳහාත්, හැකි සෑම අවස්ථාවකම සාමාන්‍ය අපරාධ නීතිය යොදා ගැනීම සඳහාත් දැනට පියවරයන් ගෙනෙමින් සිටින බව නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යවරයා විශේෂ වාර්තාකරුට දැන්වීය. එයත් අපි පිළිගත යුතුය. සාමාන්‍ය අපරාධ නිති යටතේ පොලිස් නිලධාරියෙකු වෙත කෙරෙන පාපොච්චාරනයක් පිළිනොගැනීම පමනක් එයට හේතුව නොවේ. වදහිංසා පමුණුවීම මගින් එවැනි පාපොච්චාරන ලබා ගෙන තිබිය හැකි සාමාන්‍ය අවදානමද මෙයට හේතුව වේ. මෑත මාසවලදී ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යොදා ගැනීමෙහි කැපී පෙනෙන අඩුවක් සිදුවී තිබීම පිළිබඳ විශේෂ වාර්තාකරු සෑහීමට පත්වේ. නමුත් දමිළ පුරවැසියන් ජීවත්වන උතුරු ප්‍රදේශයේ මෑතකදී එවැනි සිදුවීම් සිදුවී ඇති බව ඔහු දැන සිටී. එම තත්ත්වයන්වලදී පුද්ගලයන් මෙම නීතිය යටතේ අත්අඩංගුවට ගෙන ඇත. මෙම නීතිය තමවත් නීති පොතේ සම්පූර්ණයෙන් ඇතුළත්වී තිබෙන අතර, ත්‍රස්තවාදයට එරෙහි කටයුතු පිළිබඳ පනත හා සංශෝධනය පිළිබඳ යෝජනාවන් දැනට සමාලෝචනයට ලක්වෙමින් පවතී. තවද, අලුත් නඩුවදී ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යොදා ගැනීම අවම කිරීම සඳහාවූ පියවරයන්, දැනට වසර ගණනාවක් කිසිම නඩු විභාගයකින් තොරව ඉතාම දුක්ඛිත තත්ත්වයන් යටතේ රැඳවුම් භාරයේ සිටින පුද්ගලයන්ට කිසිම සහනයක් හෝ වාසියක් ලබා නොදෙයි.

දැනට විභාග වෙමින් පවතින ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේවූ නඩුවල යුක්තියේ ක්‍රියාවලිය දැඩි වේදනාකාරී ලෙස මන්දගාමීව සිදුවන තත්ත්වය තුළ, විත්තිය පාර්ශවයෙන් සිදුවන මන්දගාමී ප්‍රගතිය මෙයට හේතුව බව රජයේ නිලධාරීන් කිහිපදෙනෙක් යෝජනා කිරීමට උත්සාහ කළහ. මෙය සම්පූර්ණයෙන්ම පිළිගත නොහැකි තත්ත්වයක් වන අතර, අසම්පූර්ණ පැහැදිලි කිරීමක් වේ. වත්මන් අධිකරණ හා නඩු පැවරීමේ සම්පත් ඉතා සීමිත බවත්, මෙම තත්ත්වය නීතිපති දෙපාර්තමේන්තුවේ ශ්‍රේෂ්ඨ නිලධාරියෙකුගේ වචනවලින් කිවහොත් "පාලනය කර ගත නොහැකි" තත්ත්වයක් ලෙසට පත්වී ඇති බවත් ඔහු පිළිගෙන ඇත. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේවූ නඩු විභාග කිරීම සඳහා වෙනම විශේෂ මහාධිකරණ 2 ක් ස්ථාපිත කර තිබෙන අතර, මෙම මහාධිකරණ ප්‍රමාණවත් සම්පත් හා ප්‍රමාණවත් කාර්ය මණ්ඩල රහිතව ක්‍රියාත්මක වන බව විශේෂ වාර්තාකරු මෙහි සඳහන් කරයි. ලබාගෙන ගෙන ඇති මෑත කාලයේ සංඛ්‍යාලේඛණ අනුව, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ චෝදනා පත්‍ර ලබාදීමට පෙරත්, පසුවත් තවමත් පුද්ගලයන් 108 දෙනෙක් රැඳවුම් භාරයේ සිටිති.

2015 වසරේ සම්මත කරන ලද මානව හිමිකම් කවුන්සලයේ යෝජනා අංක 30/1 හරහා ශ්‍රී රජය ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අවලංගු කිරීමටත්, එය වෙනුවෙන් සමකාලීන ජාත්‍යන්තර යහපරිචයන්ට අනුව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතක් හඳුන්වාදීමටත් එකඟ විය. ශ්‍රී ලංකාවේ යෝජිත ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ ප්‍රතිපත්ති හා නෛතික රාමුවට කැබිනට් අමාත්‍යවරුන්ගේ අනුමැතිය ලැබී ඇති අතර, විශේෂ වාර්තාකරුගේ චාරිකාව ආරම්භවීමට පෙර එම පිටපත ඔහු වෙත ලබාදී තිබුණි.

විශේෂ වාර්තාකරු සමඟ අදහස් දැක්වූ බොහෝ අය මෙම යෝජනා පිළිබඳ අමාත්‍ය මට්ටමේ, පාර්ලිමේන්තු මට්ටමේ සාකච්ඡා හෝ  මහජනතාවගේ අදහස් විමසීමක් සිදුනොවීම පිළිබඳ තමන්ගේ කනස්සල්ල පලකර සිටියහ. ඇත්ත වශයෙන්ම එම කෙටුම්පත් රාමුව පිළිබඳ මානව හිමිකම් කොමිසමට දැනුම්දී නොමැත; හෝ එම කොමිසමේ අදහස් විමසා නොමැත. කෙසේවෙතත්, වත්මන් පිටපත වැදගත් වර්ධනයන් කිහිපයක් පෙන්නුම් කරයි. එය රැඳවුම් භාරයේ සිටින පුද්ගලයන් බාධාවකින් තොරව හමුවීමට මානව හිමිකම් කොමිසම අවසර ලබාදෙන අතර, ඇප ලබාදීමේදී අවසන් තීරණය ගැනීමෙන් නීතිපතිවරයාගේ තනි අයිතියද  අහෝසි කරයි. එය ස්වාධීන අධිකරණ සමාලෝචනයකට වැඩි අවකාශයක් ලබාදෙන ආකාරයෙන් පරිපාලන හා නඩුවට පෙර රැඳවුම් භාරයේ තබා ගැනීම සඳහා වැඩිදියුණු කළ රාමුවක් නිර්මාණය කරයි.

කෙසේවෙතත්, වත්මන් නීති රාමු කෙටුම්පතේ ප්‍රධාන අඩුපාඩු බොහෝමයක් තිබෙන අතර, එය නීතියක් වශයෙන් සම්මත වුවහොත් ත්‍රස්තවාදී සැකකරුවන්ගේ මානව අයිතිවාසිකම් අඛණ්ඩව උල්ලංඝනය වන තත්ත්වයක් තවදුරටත් තහවුරු කළ හැකිය.  මෙම අඩුපාඩුවල වැදගත්ම අඩුපාඩුව වන්නේ පොලිස් නිලධාරියෙකු වෙත රැඳවුම් භාරයේ යටතේ ලබාදෙන පාපොච්චාරනය පිළිගැනීමට හැකිවන ප්‍රතිපාදනය එලෙසම තබා ගැනීම වේ. රැඳවුම් භාරයේ සිටින පුද්ගලයන් බරපතල ලෙස හා පුළුල් ලෙස හිරිහැරවලට ලක්වන රටක ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතක් ජාත්‍යන්තර මානව අයිතිවාසිකම් ප්‍රමිතීන්ට අනුකූලවීමේ එකම ක්‍රමවේදය වන්නේ පොලිස් නිලධාරීන් වෙත කරන ලද පාපොච්චාරයන් භාවිතා කිරීම සම්පූර්ණයෙන් තහනම් කිරීමේ ප්‍රතිපාදනයක් මෙම පනතේ අවසන් කෙටුම්පතට නැවත හඳුන්වාදීම වේ. එය යහපත් හේතුවක් සඳහා ශ්‍රී ලංකාවේ සාමාන්‍ය නීතියේ පවතින තත්ත්වය වන අතර, වදහිංසා පමුණුවීමේ අවධානම ඉතා අධික ලෙස  පවතින ත්‍රස්තවාදය  මර්ධනය කරන පනතකට එය අනිවාර්යයෙන් තිබිය යුතුය. ත්‍රස්තවාදය පිළිබඳ පුළුල් නිර්වචනයට අදාළවද ප්‍රශ්න පවතී. එය මෙම පනත සත්‍ය ත්‍රස්තවාදයෙන් දුරස්ථව පවතින අවස්ථාවන් කෙරෙහි හෝ සුළු ජාතික ප්‍රජාවන් හෝ මානව අයිතිවාසිකම් ආරක්ෂා කරන පුද්ගලයින්ට එරෙහිව වෙනස් කොට සලකන ආකාරයෙන් හා පක්ෂපාතී ආකාරයෙන් යොදවා ගැනීමේ සත්‍ය අවධානම ඇති කරයි. තවද සාක්ෂි රැස්කර ගැනීම පිළිබඳ රාමු කෙටුම්පතේ බොහෝ ප්‍රතිපාදනවලද බරපතල ප්‍රශ්න පවතී.

මෙම නීති කෙටුම්පත සියලුම පාර්ශවයන් ඇතුළත් නොකරන තත්ත්වයට අදාළව හා ලෝකයේ මෙම ප්‍රදේශවල විදේශීය ත්‍රස්තවාදී සටන්කාමීන් කටයුතු කිරීම වැනි නූතන ත්‍රස්තවාදී තත්ත්වයන් ආමන්ත්‍රණය කිරීමටද අපොහොසත්වීම සැලකිල්ලට ගතයුතු වැදගත් කරුණු වේ.

අද වෙනකල් මෙම පනත පිළිබඳ සිදුවී ඇති ප්‍රගතිය වේදනාකාරී ලෙස මන්දගාමී ප්‍රවනතාවයක් පෙන්වන අතර, මෙය තවත් පැත්තකින් වසර 2 කට කලින් ලබාදෙන බව ශ්‍රී ලංකාව පොරොන්දුවී ඇති සන්ක්‍රාන්තික යුක්ති පියවරයන් ඇතුළුව පුළුල් පැකේජය ප්‍රමාද කර ඇත. මෙම අඩුපාඩුව වෙනසක් සිදුකිරීමට හා සියලුම දේවල්වලට වඩා වගවීමට එරෙහිව සිටින ආරක්ෂක අංශයට අයත් සමහර පුද්ගලයන්ගේ අඛණ්ඩ බලපෑම පිළිබිඹු කරන බව නිගමනය කිරීමට මඟ පෑදේ.

මෙම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පෙර එය වැඩිදියුණු කිරීමේ ප්‍රයත්නයක් වශයෙන් මගේ මැන්ඩේට් බලය සමඟ ඵලදායි සංවාද ක්‍රියාවලියක යෙදීමට රජය එකඟ වී ඇති බව මම අද දින සතුටින් නිවේදනය කරමි. මෙම පනත ශ්‍රී ලංකාවේ නව ප්‍රවනතාවයේ සන්ධිස්ථානයක් කිරීම සඳහා එය නිවැරදි කර ගැනීමට තවමත් කල් තිබේ.  ඊලඟ සති 2 ක කාලය තුළ ජීනිවාහි සිටින මගේ

කණ්ඩායම සමඟ මේ පිළිබඳ සාකච්ඡා කිරීමට විදේශ කටයුතු අමාත්‍යාංශය එකඟතාවය පලකර ඇත. මෙම සංවාදයේ අරමුණ වන්නේ වත්මන් කෙටුම්පතේ තිබෙන අඩුපාඩු හඳුනා ගැනීම හා ඒවා නිවැරදි කිරීම සඳහා විසඳුම් සෙවීම වේ.

එමනිසා, අවසානයේදී මදකට නැවතී සමස්ථ චිත්‍රය දෙස බැලීම වැදගත් වේ. යහපත් චේතනාවකින් සතුව බොහෝ ප්‍රකාශ නිකුත්වී තිබේ. නමුත් අද වන තෙක් ගැටුමට ස්ථිරසාර හා යුක්තිසහගත විසඳුමක් ගෙන ඒම සඳහා ක්‍රියාකාරකමක් වශයෙන් කිසිදෙයක් සිදුවී නැත. එසේ යම් ක්‍රියාකාරකමක් සිදුකළහොත් එය සමාජයේ සියලුම අංශවල විශ්වසායට භාජනය වනු ඇත. දැනට එම දිශාව කෙරෙහි අවම වශයෙන් යම් යම් පියවරයන් ගනු ලබන බව පෙනේ. රජය හා ශ්‍රී ලංකාවාසී ජනතාව වෙත මා ඉදිරිපත් කරන ඉල්ලීම වන්නේ ඒවා නිවැරදි පියවරයන් විය යුතු බවයි; ආරක්ෂක අංශයේ සිටින ප්‍රතිගාමී කණ්ඩායම් හා රජයේ සිටින ඔවුන්ගේ සගයන් විසින් එම ක්‍රියාවලිය අන් අතකට හැරවීමට ඉඩ නොතැබිය යුතු බවත් මා ඉල්ලා සිටිමි.

වගවීමේ තත්ත්වය පිළිබඳ දෙපාර්ශවයම වෙන් වෙන් වශයෙන් සමාලෝචනයට ලක් කරන විට එහි ප්‍රතිඵලයක් වශයෙන් ලැබෙන චිත්‍රය ඉතාම අඳුරු එකක් වේ: ඒ අකාරයෙන් ගැටුම් කාල වාකවානුවේ හා ගැටුමෙන් පසු බරපතල මානව හිමිකම් උල්ලංඝනය කර ඇති ආරක්ෂක හමුදාවල හා ආරක්ෂක සේවාවල සාමාජිකයන් වගවීමට ලක් කිරීම සඳහා රජය කිසි දෙයක් කර නොමැත. නමුත් එය අද වන තෙක් කෲර හා අසාධාරණ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතට අදාළ පද්ධතිය අඛණ්ඩව ක්‍රියාත්මක කරයි. එම ක්‍රමවේදය දෙමළ සුළු ජනතාව කෙරෙහි විශාල වශයෙන් බලපෑමක් සිදුකර ඇත. මෙම තත්ත්වයන් අත්‍යවශ්‍යයෙන්ම ඔඩු දුවන දුක් ගැනවිලි නිර්මාණය කළ හැකිය. එවැනි තත්ත්වයන් නොසන්සුන්තාවය පෝෂණය කිරීමටත්, ගැටුමක් නැවත අවිස්සීමටත් ඉවහල් විය හැකිය.

මානව අයිතිවාසිකම් කවුන්සලයේ 35 වන සැසි වාරයේදී සිය ආරම්භක ප්‍රකාශනයේදී එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස්වරයා සඳහන් කළ ආකාරයට:

"ත්‍රස්තවාදය මර්ධනය කිරීමේ ක්‍රියාකාරකම් හරහා බුද්ධිමත් ආකාරයෙන් නඩු පැවරිය යුතුය; ඒ කියන්නේ සියලුම පුද්ගලයන්ගේ මානව අයිතිවාසිකම් ආරක්ෂා කරන ආකාරයෙන් එය සිදුකළ යුතුය. කරුණාකර මෙය මතක තබා ගන්න: ත්‍රස්තවාදය මර්ධනය කරන අපැහැදිලි නීතියක් යටතේ රැඳවුම් භාරයේ තබා ගෙන සිටින සියලුම පුරවැසියන් අපයෝජනයට හෝ වදහිංසාවට ලක්කර ඇත; මෙය බලධාරීන්ට එරෙහිව දුක් ගැනවිල්ලක් සිතේ තබා ගෙන සිටින එක පුද්ගලයෙක් නොවේ; ඔවුන්ගේ පවුලේ බොහෝ අයද එලෙස දුක් ගැනවිලි සිතේ සිර කර ගෙන සිටිය හැකිය. එක අහිංසක පුද්ගලයෙක් සිරගත කරන විට, ඔබ පවුල් සාමාජිකයන් 6 දෙනෙක් හෝ 7 දෙනෙක් රජයට එරෙහිව කටයුතු කරන පුද්ගලයන්ගේ ග්‍රහණය තුළට යැවිය හැකිය. එම පුද්ගලයන්ගෙන් කිහිප දෙනෙක් ඉන් ඔබ්බටද යා හැකිය. වැරදි ලෙස රැඳවුම් භාරයේ තබා ගැනීමේ පාඩුව, එයින් ලබා ගැනීමට බලාපොරොත්තු ප්‍රතිලාභවලට වඩා අධික වේ. ප්‍රචණ්ඩකාරී ත්‍රස්තවාදය වැළැක්වීම සඳහා අපි දැඩි ස්ථාවරයක සිටිය යුතු අතර, එයට විරුද්ධ පැත්ත ගත යුතුව ඇත: සාමකාමීව සියලු දෙනාම ඇතුළත් කර ගැනීම."

**නිමාව**

බෙන් එමර්සන් මහතා (එක්සත් රාජධානිය) ත්‍රස්තවාදයට එරෙහිව කටයුතු කරන අවස්ථාවල මානව අයිතිවාසිකම් හා මූලික නිදහස් ප්‍රවර්ධනය කර, ආරක්ෂා කිරීම සඳහාවූ විශේෂ වාර්තාකරු වේ. එක්සත් ජාතීන්ගේ පෙර තිබූ මානව අයිතිවාසිකම් කොමිසම විසින් 2005 වසරේදී නිර්මාණය කරන ලද මැන්ඩේට් බලය අනුව ඔහු 2011 අගෝස්තු 1 වෙනි දින සිය රාජකාරි කටයුතු බාර ගත්තේය. මෙම මැන්ඩේට් බලය 2007 දෙසැම්බර් මාසයේ වසර 3 ක් කාලය සඳහා අලුත් කරන ලද අතර, 2010 සැප්තැම්බර් මාසයේදීත්, නැවත 2013 මාර්තු මාසයේදීත් අලුත් කරන ලදී.

විශේෂ වාර්තාකරුවන් මානව අයිතිවාසිකම් කවුන්සිලයේ විශේෂ ක්‍රියා පිළිවෙත්වල කොටසක් වේ. එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් පද්ධතියේ විශාලතම ස්වාධීන විශේෂඥයන්ගේ සමූහය වන විශේෂ ක්‍රියා පිළිවෙත්, කවුන්සිලයේ ස්වාධීනව කරුණු රැස් කරන හා අධීක්ෂණය කරන යාන්ත්‍රණයන්වල පොදු නාමය වේ. එම යාන්ත්‍රණයන් නිශ්චිත රටක පවතින තත්ත්වයන් ආමන්ත්‍රණය කරයි; එසේ නැත්නම් ලෝකයේ සියලුම ප්‍රදේශවල තේමාවන්වලට අදාළ ගැටලු ආමන්ත්‍රණය කරයි. විශේෂ පිළිවෙත් පිළිබඳ විශේෂඥයන් ස්වේච්ඡා පදනමක් මත සේවය කරයි; ඔවුන් එක්සත් ජාතීන්ගේ කාර්ය මණ්ඩලය නොවන අතර,තමන් කරන වැඩ සඳහා වේතනයක්ද ලබා නොගනිති. ඔවුන් කිසිම රජයකට හෝ සංවිධානයකට සම්බන්ධ නොවන ස්වාධීන පුද්ගලයන් වන අතර, තමන්ගේ පුද්ගලික තත්ත්වය යටතේ සේවය කරති.

බලන්න: UN 2006 Global Counter-Terrorism Strategy

UN Human Rights, country page: Sri Lanka

වැඩිදුර තොරතුරු හා මාධ්‍ය ඉල්ලීම් සඳහා කරුණාකර සම්බන්ධ වන්න:

කොළඹදී (චාරිකාව සිදුවන කාල වකවානුවේ): ජූලියා රෝ මහත්මිය (+ 94 (0)11 2580691 ext. 2408 / julia.raue@one.un.org)

ජිනිවාහිදී **(ගමනට පෙර හා පසු) : ෂැරොෆ් අසිසෝව්** Azizov (+41 22 917 9748 / sazizov@ohchr.org) or write to srct@ohchr.org

එක්සත් ජාතීන්ගේ අනෙකුත් ස්වාධීන විශේෂඥයන්ට අදාළ මාධ්‍ය විමසීම් සඳහා :

සේබියර් සෙලායා , එජා මානව අයිතිවාසිකම්- මාධ්‍ය ඒකකය (+ 41 22 917 9383 / xcelaya@ohchr.org)

ඔබගේ ප්‍රවෘත්ති වෙබ් අඩවි හා **සමාජ ජාල සඳහා** : අපගේ ප්‍රවෘත්ති නිවේදනයන්ට අදාළ බහු මාධ්‍ය අන්තර්ගතය හා ප්‍රධාන පණිවුඩයන් පහත සඳහන් කර ඇති එජා මානව අයිතිවාසිකම් සමාජ මාධ්‍ය නාලිකාවලින් ලබා ගත හැකිය. කරුණාකර උචිත handles භාවිතා කර අප සමඟ සම්බන්ධ වන්න.

Twitter: @UNHumanRights
Facebook: unitednationshumanrights
Instagram: unitednationshumanrights

Google+: unitednationshumanrights
Youtube: unohchr